# ලංසු සඳහා ආරාධනයයි

## කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය

## බස්නාහිර පළාත

බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන පහත දැක්වෙන විශේෂ ව්‍යාපෘතියට අදාලව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

| ව්‍යාපෘතියේ නම | ආපසු නොගෙවන ගාස්තුව | ලංසු සුරක්ෂණයේ වටිනාකම |
|---|---|---|
| **ගොවිපල යාන්ත්‍රීකරණ ව්‍යාපෘතිය සඳහා ද්විරෝද අත්ට්‍රැක්ටර් හා සිව්රෝද ට්‍රැක්ටර් මිළදීගැනීම** | රු. 4,000.00 | රු. 150,000.00<br><br>(2021-02-23 දින දක්වා වලංගු විය යුතුය - දින 105) |

1. ජාතික තරගකාරී ලංසු ඇගයීමේ කාර්ය පටිපාටිය අනුව මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරනු ලැබේ.
2. අමාත්‍යාංශ ලේකම් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ආපසු නොගෙවනු ලබන ලංසු ගාස්තුව මුදලින් ගෙවා ලංසු ලියවිලි කට්ටල 2020.10.26 දින සිට 2020.11.16 දින තෙක් රජයේ වැඩ කරන දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත සඳහන් ලිපිනයෙහි පිහිටා ඇති බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ආයතන අංශය වෙතින් ලබා ගත හැකිය.
3. ලියාපදිංචි තැපෑලෙන් හෝ අමාත්‍යාංශයේ ආයතන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් හෝ ලංසු ඉදිරිපත් කළ හැකි අතර 2020.11.17 දින පෙ.ව. 10.00 දක්වා ලංසු භාරගනු ලැබේ. භාරගන්නා වේලාව අවසන් වූ වහාම අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී එම ලංසු විවෘත කරනු ලැබේ.
4. එම අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ලිඛිත අවසරයක් ලත් ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
5. මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතනයකින්, "ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බස්නාහිර පළාත)" නමින් ලබාගත්, ඉහත වටිනාකමින් හා වලංගුතාවයෙන් යුත් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතුය.
6. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිගේ තීරණය අවසන් තීරණය වේ.
7. වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකතන අංක 011-2092660 මගින් බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහකාර ලේකම් ඇමතීමෙන් ලබාගත හැකිය.

සභාපති
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ
ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත
7වන මහල, 204, බස්නාහිර පළාත් සභාව,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.